පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය: 7

# දෙවන වාර පරීක්ෂණය - 2018
# සිංහල භාෂාව හා සාහිත්‍යය

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2 යි.

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **අංක 1 , 2 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියැ වී ඇති පදය තෝරන්න.**

1.
1. ආන්ඩුව 2. ශබ්ද 3. අර්තාවබෝධය 4. මාද්‍ය

2.
1. ප්‍රදර්ෂන 2. ඇතුලත 3. චේදය 4. කවුළුව

3. මුලින් දී ඇති පදයට අර්ථයෙන් සමාන නොවන පදය තෝරන්න.
නෙලුම් -

1. පද්ම 2. තඹර 3. උපුල් 4. කමල

4. අහිකුණ්ඨික ජනතාව " සත් " යන පදයෙන් අදහස් කරන්නේ,

1. කළය 2. ඇඹරුම් ගල 3. කුල්ල 4. වංගෙඩිය

5. පුරාවෘත්ත යනුවෙන් අදහස් කරන්නේ,
1. නවීන කතා 2. පැරණි කතා පුවත් 3. නවීන ලේඛන 4. පැරණි ලේඛන

- **පහත වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

6. විමලසිරි ක්‍රීඩා තරගයට සූදානම් ......................................
1. වූවා ය. 2. වූවෝ ය. 3. වූහ. 4. වූවේ ය.

7. නුඹලා කතන්දර පොත් ..................................................

1. බලයි. 2. බලන්නෝය. 3. බලහු. 4. බලති.

8. වනසත්තු වනාන්තරයේ ඔබ මොබ ..............................

1. සැරිසරති. 2. සැරිසරයි. 3. සැරිසරන්නේය. 4. සැරිසරන්නීය.

9. මේසය මත තිබූ පොත් පත් සුළඟට විසිරී ......................

1. ගියා ය. 2. ගියේ ය. 3. ගිය හ. 4. ගියෝ ය.

10. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න
බාහිර -
1. අභ්‍යන්තර 2. අන්තර 3. නිරන්තර 4. සමාන්තර

11. පහත පද අතුරින් අනුක්ත පදයක් වන්නේ කුමක් ද?
1. සිරකරුවෙක් 2. යාචකයෙක් 3. ශිෂ්‍යාවක 4. ගායිකාවෝ

12. උත්තම පුරුෂ බහුවචන නාම පදයක් වන්නේ,
1. අපි 2. පූජකතුමා 3. නුඹලා 4. නිළිය



EXAMRESULTS.LK

- **පහත වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය තෝරන්න.**

13. ගොවියෝ ගොයම් **කපමින්** කවි කියති.

1. මිශ්‍ර ක්‍රියා 2. පූර්ව ක්‍රියා 3. විධි ක්‍රියා 4. අසම්භාව්‍ය ක්‍රියා

14. ළමයි වතුරට **පැන** සෙල්ලම් කළහ.

1. අසම්භාවය ක්‍රියා 2. විධි ක්‍රියා 3. පූර්ව ක්‍රියා 4. මිශ්‍ර ක්‍රියා

15. " නස්පැත්තිය " යන ප්‍රාදේශීය යෙදුම වෙනුවට පොදුවේ භාවිත වන වචනය තෝරන්න.

1. සිහිවටනය 2. බියවීම 3. උසයාම 4. විනාශය

16. කමත් භාෂාවේ දී "පැගිරිබෝය පිරීම" යනුවෙන් ව්‍යවහාර කරන්නේ,

1. ගිනි මැළ ගැසීම
2. බුලත් විට කෑම
3. දවල් ආහාරය ගැනීම
4. කෝපි බීම

17. " නිෂ්ඵල ක්‍රියාවක් කිරීම " යන්න හඟවන ඉගිවැකිය තෝරන්න.

1. කිඹුල් කඳුළු හෙළීම
2. කුනිස්සන්ට දූල් දැමීම
3. අන්තිම ඉත්තත් ඇදීම
4. බක තපස් රැකීම

18. 'උදවු උපකාර කළ පුද්ගලයෙකුට සතුරුකම් කිරීම' යන අදහස දෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

1. වෙඩි කෑ ඌරකු වාගේ
2. ඇත්තක් කියා පැත්තක් ගියත් කමක් නෑ
3. කන්න දීපු අත හපා කනවා වාගේ
4. අත හයිය නම් බත වරදින්නෙ නෑ

19. "කෝමළ රේඛා" නම් පද්‍ය සංග්‍රහය නිර්මාණය කරන ලද්දේ,

1. ගරු මර්සලින් ජයකොඩි පියතුමා
2. එස්.මහින්ද හිමි
3. කුමාරතුංග මුණිදාස කවියා
4. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ මයා

20. පහත කවිය සම්පූර්ණ වීමට අදාළ නිවැරදි කවි පදය තෝරන්න.

මේ කාගේ දෝ කමතා
සඳ දෙවියන්ගේ කමතා
සඳ දෙවියෝ වැඩි කමතා
.......................................................

1. ඉරු දෙවියන්ගේ කමතා 2. සඳ දෙවියන් බැත දෙවතා 3. මේ කාගේ මේ කමතා 4. සැම දෙවියෝ බිම් බඳිතා

(ලකුණු 40)

## II කොටස

1. දී ඇති මාතෘකා අතුරින් එකක් තෝරාගෙන රචනාවක් ලියන්න.

   i. වැඩිහිටියන්ට ගරු කරමු.

   ii. පරිසරය පණමෙන් සුරකිමු.

   iii. පොදු දේපළ සුරකිමු.

   iv. සමඟියෙන් ජීවත් වෙමු.

(ලකුණු 20 යි )

2. පහත ප්‍රකාශ

අ) උපුටාගත් පාඩමේ නම,

ආ) කීවේ කවු ද?

ඉ) කිවේ කාට ද?

යන්න ලියන්න.

   i. " ඇයි තොප කුමට අවුදැ'යි "

   ii. " මොකට ද අයියේ කුඹුරට යතුරක් ?"

   iii. " අන්න කවුද ළමයෙක් නැතිවෙලාලු "

   iv. " මම මේක තියාගන්න ද ? "

   v. " බැහැ, බැහැ, ඔබ මා එතැනට කැඳවා ගෙන ගොස් පැන දුවාවි."

(ලකුණු 3 × 5 = 15 යි )

3. පහත කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

පෙර දැක නොමැති මුත් සුන්දරහාමි විසින්
මගෙ තොරතුරු ඇසූ හැටි හිතවතෙකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුලේ තැඹිලි ගසින්
පිළිගැන්වීය මට සොම්නස් පිරුණු නෙතින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත්කමයි හැමතැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළගුණ සැලකිය යුත්තේ
දුන් සත පනහවත් ඔහු නැත පිළිගත්තේ

   i. සුන්දරහාමි ආගන්තුකයාට පිළිගැන්වූයේ මොනවා ද?

   ii. ආගන්තුකයා කළගුණ සැලකීම සිදු කළේ කෙසේ ද?

   iii. සුන්දරහාමි සතු යහපත් ගති ලක්ෂණ දෙකක් ලියන්න.

   iv. මෙම කවිවලින් කියවෙන්නේ කුමන පරිසරයක් ගැන ද?

   v. පහත වචනවලට විරුද්ධ වචන කවියෙන් තෝරා ලියන්න.
   අ) දොම්නස ආ) පොහොසත්

(ලකුණු 2 × 5 = 10 යි )

4.

   i. ඔබ පාසලේ සිංහල භාෂා ඒකකය මඟින් සංවිධාන කරනු ලබන " ප්‍රතිභා " වාර්ෂික සඟරාව එළි දැක්වීමේ උත්සවය මෙවරත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වේ. ඒ සඳහා දෙමව්පියන් වෙත ආරාධනා කිරීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. දිනය, වේලාව, ආරාධිත අමුත්තා ඔබට කැමති පරිදි යොදා ගන්න.

   ii. අනුරාධපුර පිහිටිවැව " අරුණ " ළමා සමාජයට කලක් තිස්සේ අඩුපාඩුවක් ව පවතින ක්‍රීඩාභාණ්ඩ ඉල්ලා පළාතේ ක්‍රීඩා අධ්‍යක්ෂතුමා වෙත යැවීමට සුදුසු ලිපිය ලියන්න. (ඔබ "අරුණ" ළමා සමාජයේ ලේකම් යැයි සිතන්න.)

(ලකුණු 15 යි )